# ඩී.එස්. සේනානායක විදුහල, කොළඹ 07.

**අවසාන වාර ඇගයීම - 2016**
**12 ශ්‍රේණිය**
**ව්‍යාපාර අධ්‍යයනය - 1 කොටස**

*කාලය පැය 1*

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

01. ව්‍යාපාර විකාශයේ විවිධ අවස්ථා පහත දැක්වේ
A- අතිරික්ත නිෂ්පාදනය
B- මුදල් භාවිතය
C- වෙළෙඳාම
D- භාණ්ඩ හුවමාරුව
E- උපකාරක සේවා

ඉහත සඳහන් පියවර අනුපිළිවෙලින් දැක්වූ විට නිවැරදි පිළිතුර වන්නේ,
1) A, D, C, B, E    2) A, C, D, B, E    3) A, B, C, D, E
4) A, B, C, E, D    5) A, C, B, E, D

02. ද්විතික කර්මාන්තයේ යෙදී සිටින පුද්ගලයන් පමණක් අයත් කාණ්ඩය වන්නේ,
1) මසුන් මරන්නා, පුවත්පත් කලාවේදියා, වඩු කාර්මිකයා
2) වඩු කාර්මිකයා, ජංගම දුරකථන නිෂ්පාදකයා, මෝටර් රථ අළුත්වැඩියා කරන්නා
3) සංගීතඥයා, වඩු කාර්මිකයා, වෛද්‍යවරයා
4) ධීවරයා, ගුරුවරයා, මෝටර් රථ අළුත්වැඩියා කරන්නා
5) ජංගම දුරකථන නිෂ්පාදකයා, මෝටර් රථ නිෂ්පාදකයා, පැන්සල් කර්මාන්තයේ නියැලෙන්නා

The National e-learning Portal for The General Education

03. ව්‍යාපාර ආසන්න පරිසර බලවේග හා ඔවුන්ට අදාළ අවස්ථා හා තර්ජන කිපයක් පහත දැක්වේ.

| ආසන්න පරිසර | අවස්ථා හා තර්ජන |
|---|---|
| A ගනුදෙනු කරුවන් | 1- කලට වේලාවට භාණ්ඩ සැපයීම, අඩු මිලට භාණ්ඩ නොසැපයීම. |
| B තරඟ කරුවන් | 2- ආදේශක භාණ්ඩ නිපදවන්නන් බහුලවීම හෝ එවැන්නන් බහුලව නොසිටීම. |
| C සැපයුම් කරුවන් | 3- ක්‍රය ශක්තිය ඉහළ මට්ටමක පැවතීම දැනුම පහළ මට්ටමක පැවතීම. |
| D ආදේශ භාණ්ඩ නිපදවන්නන් | 4- නව තරඟකරුවන් වෙළෙඳ පොළට පිවිසීම හෝ සිටින අය ඉවත්වීම |

ගැලපෙන කාණ්ඩය තෝරන්න.
1) A-3, B-1, C-4, D-2    2) A-3, B-4, C-1, D-2    3) A-3, B-2, C-4, D-3
4) A-2, B-3, C-4, D-1    5) A-1, B-2, C-3, D-4

04. ව්‍යාපාරයකින් ඉටුවිය යුතු සමාජ වගකීම් අතුරින් සේවකයාට ඉටුවිය යුතු සමාජ වගකීම් පමණක් ඇතුළත් කාණ්ඩය වන්නේ,
A- සාධාරණ මිලට භාණ්ඩ සැපයීම
B- වෘත්තිමය ආරක්ෂාව
C- ආරක්ෂිත නිෂ්පාදිත
D- සමානාත්මතාව
E- අපද්‍රව්‍ය කළමනාකරණය
F- නිසි පරිදි වැටුප් ගෙවීම

1) A, B, F    2) A,C,E    3) A,D,F
4) B,D,F    5) B,D,E

05. පහත ප්‍රකාශිත අයිතිවාසිකම් අතුරින් පාරිභෝගික ජාත්‍යන්තර ය විසින් ප්‍රකාශිත අයිතිවාසිකම් පමණක් ඇතුළත් කාණ්ඩය වන්නේ,

A- වන්දි ලබාගැනීමට ඇති අයිතිය
B- තොරතුරු දැනගැනීමට ඇති අයිතිය
C- පාරිභෝගික අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය
D- සවන් යොමු කරවා ගැනීමට ඇති අයිතිය
E- සෞඛ්‍යය සම්පන්න පරිසරයක ජීවත්වීමට ඇති අයිතිය

1) A,C,E 2) A,B,E 3) B,C,E
4) B,C,D 5) C,D,E

06. කේවල ස්වාමි ව්‍යාපාරයක් හා හවුල් ව්‍යාපාරයක් යන සංවිධාන දෙකටම පොදු වූ කරුණු ඇතුලත් කාණ්ඩය තෝරන්න.

1) නීතිමය පුද්ගලභාවයක් නැත
2) සමාගම් නීතිය බලපායි
3) වගකීම අසීමිත වේ
4) ව්‍යාපාර නාම ආඥා පණත බලපායි
5) අඛණ්ඩ පැවැත්මක් ඇත

1) 1,3,5 2) 1,3,4 3) 1,2,4 4) 2,3,4 5) 1,2,3

07. සමුපකාර සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය කුමක්ද ?

1) සමුපකාර ව්‍යාපාරය ප්‍රතිපත්ති මත ක්‍රියාත්මක වේ.
2) ගනුදෙනුකරුවන්ම අයිතිකරුවන් වේ.
3) රාජ්‍ය අංශය සතු ව්‍යාපාර සංවිධානයකි.
4) එක් කොටස් හිමියකුට හිමිවන්නේ එක් ඡන්දයක් පමණි.
5) අනුග්‍රාහක ප්‍රති ගෙවීමක් සිදු කරයි.

08. පහත දැක්වෙන අවස්ථා අතුරින් වර්තමානයේ ව්‍යවසායකයකු බිහිවීමට බලපාන ප්‍රධානම සාධකය වන්නේ,

1) සම්පත්වල විකල්ප ප්‍රයෝජන පැවතීම
2) විශාල තොරතුරු ප්‍රමාණයක් පැවතීම
3) විද්‍යුත් වාණිජ්‍යයේ ව්‍යාප්තිය
4) තරඟකාරීත්වය
5) රජයේ අනුග්‍රහය

09. කුඩා ව්‍යාපාර හඳුනාගැනීම සඳහා යොදාගන්නා ප්‍රමාණාත්මක නිර්ණායකයක් වන්නේ,

1) භාවිත කරන තාක්ෂණය
2) ව්‍යාපාරයේ ස්වභාවය
3) ප්‍රයෝජනයට ගන්නා බලශක්ති ප්‍රමාණය
4) වෙළෙඳපොළ ස්වභාවය
5) ව්‍යාපාර සංවිධාන ක්‍රමය

10. පහත සඳහන් ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

1) ඉහළම ද්‍රවශීලතාවක් ඇති වත්කම් මුදල්ය.
2) පොදු පිළිගැනීමක් ඇති ඕනෑම දෙයක් මුදල් ය.
3) චෙක්පත් මුදල් වලට වඩා ද්‍රවශීලතාවයෙන් ඉහළය.
4) රු 100 නෝට්ටුව නියෝජනය කරන්නේ සීමාසහිත වලංගු මුදල්ය.
5) ඉහත සියල්ල නිවැරදි ය.

11. නිෂ්පාදිත ........................................ අනුව භාණ්ඩ හා සේවා වශයෙන් වර්ග කළහැකි අතර, නිතර නිතර මිලදී ගන්නා භාණ්ඩ ........................................ වන අතර ........................................ නිතර නිතර නොසොයන භාණ්ඩ ........................................වේ.

12. අ. ස්ත්‍රී පුරුෂභාවය, අධ්‍යාපන මට්ටම හා පවුල් සංයුතිය ............................ පරිසරයට අයත් සාධක වන අතර, ප්‍රතිමාන. ආකල්ප, විශ්වාස අභනාකම් ............................ අයත් වේ.

ආ. ගනුදෙනුකරුවන් සැපයුම්කරුවන් ........................................ පරිසරයට අයත් වන අතර අයිතිකරුවන් සේවකයන් ........................................ පරිසරයට අයත් වේ.

13. අ. හවුල් ඔප්පුවක් අනිවාර්යයෙන්ම ............................ තබා ගතයුතු අතර, ............................ ඒ සඳහා බලපාන පනත වන්නේ ............................යි.

ආ. වෘත්තිය හවුල් ව්‍යාපාරයක උපරිම සාමාජික සංඛ්‍යාව ............................ වන අතර ............................පනත මගින් නිරූපණය වේ.

14. අ. කොටස් ප්‍රාග්ධනයක් නොමැති සමාගම් .............................................. වන අතර ....................................................සමාගම් අක්වෙරළ සමාගම් වේ.

ආ. පෞද්ගලික සමාගමක අවම අධ්‍යක්ෂවරුන් ............................................................... සිටිය යුතු අතර සමුපකාරයක අවම අධ්‍යක්ෂවරුන් ......................................................... සිටිය යුතුය.

15. අ. රටක මූල්‍ය අධිකාරියේ නියෝග මත නිකුත් කරනු ලබන කාසි හා නෝට්ටු ................................... ලෙසත් වාණිජ බැංකු පවත්වාගෙන යන ජංගම ගිණුම්වල ශේෂ ............................................... ලෙසත් හඳුන්වයි.

ආ. චෙක්පත් ........................................... හා ........................................... වශයෙන් කොටස් දෙකක් වන අතර, චෙක්පත් රේඛනය ........................................ හා ..........................................වශයෙන් කොටස් දෙකකි.

16. නිෂ්පාදනයේ ස්වභාවය අනුව හා අංශය අනුව ව්‍යාපාර වර්ග කර දක්වන්න.

| නිෂ්පාදනයේ ස්වභාවය | නිෂ්පාදන අංශය |
|---|---|
| ...................................... | ...................................... |
| ...................................... | ...................................... |
| ...................................... | ...................................... |

17. පහත දැක්වෙන හිස්තැන් සම්පූර්ණ කරන්න.

| පාර්ශ්වය | ඇල්ම දැක්වීමට හේතු |
|---|---|
| 1. අයිතිකරුවන් | ...................................... |
| 2. සේවකයින් | ...................................... |
| 3. ගනුදෙනුකරුවන් | ...................................... |
| 4. ණයහිමියන් | ...................................... |

18. සෙසු ව්‍යාපාර වලට සාපේක්ෂව සමුපකාර වල දක්නට ලැබෙන ආවේණික වූ ලක්ෂණ දෙකක් දක්වන්න.

1. ................................................................................................
2. ................................................................................................

19. ණය පතකට සම්බන්ධ පාර්ශ්ව දක්වන්න

1. ........................................ 3. ......................................
2. ........................................ 4. ......................................

20. විද්‍යුත් බැංකුකරණය සිදුවන ආකාර දෙකක් දක්වන්න.

1. ................................................................................................
2. ................................................................................................

ඉ-තක්සලාව අධ්‍යාපන The National e-learning Portal for The General Education

## ඩී.එස්. සේනානායක විද්‍යාලය, කොළඹ 07.

**අවසාන වාර ඇගයීම - 2016**
**12 ශ්‍රේණිය**
**ව්‍යාපාර අධ්‍යයනය - II කොටස**

කාලය පැය 2

**පහත ප්‍රශ්නවලින් ඕනෑම ප්‍රශ්න තුනක් තෝරාගෙන පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම සමානව ලකුණු ලැබේ.**

01. i. "ගුණපාල ධීවර ව්‍යාපාරිකයෙකි. ඔහුගේ යාත්‍රා සෑම දිනකම මුහුදු ගොස් විශාල මාළු තොගයක් අල්ලා ගනී. ඊට හේතුව ඔහු ට්‍රෝලර් යාත්‍රා මගින් රේඩාර් උපයෝගී කරගෙන මාළු අල්ලා ගැනීමයි"

අ. ගුණපාලගේ ව්‍යාපාරය කුමන ව්‍යාපාර වර්ගීකරණයට අයත් වේද ? ව්‍යාපාර වර්ගීකරණ පදනම මත විස්තර කරන්න. (ලකුණු 02)

ආ. ගුණපාලගේ ව්‍යාපාරය යොදාගන්නා නිෂ්පාදන සාධක (යෙදවුම්) හතරක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 01)

ඉ. මෙම ව්‍යාපාරයේ නිෂ්පාදිත භාවිත අනුව වර්ග කර දක්වන්න. (ලකුණු 01)

ii. අ. "ව්‍යාපාරයන්හි පදනම ගනුදෙනුකරුවන්ය" පැහැදිලි කරන්න. (ලකුණු 02)

ආ. "ව්‍යාපාර විවිධ කාර්යයන් වල නිරත වන බව දක්නට ලැබේ. ව්‍යාපාර විසින් සිදු කරනු ලබන මූලික කාර්යයන් කවරේදැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

iii. "ගුණසේන පොත් සමාගමේ සේවය කළ සිරිදාස එම ආයතනයෙන් ඉවත්වී තමන්ගේ පොත් සාප්පුවක් වසර අගදී නගරයේ විශාල පාසලක් අසල අරඹයි"

අ. ඉහත සඳහන් සිරිදාසගේ ව්‍යාපාරයට උදා කරගත හැකි පරිසර අවස්ථා දෙකක් දක්වන්න. (ලකුණු 02)

ආ. සිරිදාසගේ ව්‍යාපාරයට අහිත කර බලපෑම් එල්ල කළ හැකි තමන්ට පාලනය කරගත නොහැකි තර්ජන දෙකක් දක්වන්න. (ලකුණු 02)

iv. පහත සඳහන් සිද්ධීන් නිසා මතුවන ව්‍යාපාර පරිසරය තුළින් හට ගන්නා ව්‍යාපාර අවස්ථාවන් දක්වන්න.

අ. සමාජයේ වැඩිහිටියන්ගේ 75% ක් දියවැඩියා රෝගයට ගොදුරු වීම.

ආ. සිංහල හින්දු අලුත් අවුරුද්ද නොබෝ දිනකින් උදාවීම.

ඉ. මඳුරු උවදුර නිසා "සීකා රෝගය" පැතිර යාම.

ඊ. වියළි කාලගුණය දිගටම පැවතීම. (ලකුණු 04)

v. අ. ව්‍යාපාර සමාජ වගකීම් ඉටු කිරීමෙන් ව්‍යාපාරයකට ලැබෙන ප්‍රතිලාභ කවරේද ?(ලකුණු 02)

ආ. ව්‍යාපාර ආචාර ධර්ම ව්‍යාපාරයකට වැදගත් වන්නේ කෙසේද ? සේවකයින් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 02)

02. i. අ. රජය ව්‍යාපාර වලට බලපෑම් කරන ආකාර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

ආ. රජයක් ළඟා කර ගැනීමට අපේක්ෂිත ආර්ථික අරමුණු කවරේද ? (ලකුණු 01)

ඉ. රජයේ අරමුණු ඉටු කරගැනීමට ව්‍යාපාර කටයුතු කළයුත්තේ කෙසේද ? (ලකුණු 01)

ii. " පසුගිය අයවැය මගින් ඉදිරිපත් කළ යෝජනා පසුව සංශෝධනය විය"

අ. ඉහත ප්‍රකාශය මගින් කියැවෙන රජයේ ප්‍රතිපත්තිය කුමක්ද ? (ලකුණු 01)

ආ. එම ප්‍රතිපත්තියේ අරමුණ කුමක්ද ? (ලකුණු 01)

ඉ. බදු විතැන් කිරීමේ හැකියාව හා බදු පදනම මත බදු වර්ග කර දක්වන්න. (ලකුණු 02)

iii. අ. ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයන් භාණ්ඩ මිලදී ගැනීමේදී මුහුණ දෙන විෂමාචාර කවරේද ? (ලකුණු 02)

ආ. එම විෂමචාර ඉවත් කිරීමට රජයකට ගතහැකි ක්‍රියාමාර්ග කවරේද ? (ලකුණු 02)

vi. අ. ප්‍රමිතියක් යනු කුමක්ද ? (ලකුණු 01)

ආ. ශ්‍රී ලංකාවේ ප්‍රමිති අනිවාර්යය කර ඇති ආහාර වර්ග හතරක් දක්වන්න. (ලකුණු 01)

ඉ. ISO : 22000, ISO : 27000
ISO : 26000, ISO : 14000
ප්‍රමිති නිකුත් කරන්නේ කුමක් සම්බන්ධයෙන්ද ? (ලකුණු 02)

v. "ලංකාව වැනි රටවල කුඩා ව්‍යාපාර වල වර්ධනය රටේ සංවර්ධනයට පිහිවහලකි."

අ. කුඩා ව්‍යාපාර වර්ගීකරණය කළහැකි නිර්ණායක කවරේද ? (ලකුණු 02)

ආ. කුඩා ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන සාධක කවරේද ? (ලකුණු 02)

03. i. අ. ව්‍යාපාර සංකල්ප වන නෛතික පුද්ගලභාවය, අඛණ්ඩ පැවැත්ම, අසීමිත වගකීම, ව්‍යාපාර ලියාපදිංචිය විස්තර කරන්න. (ලකුණු 02)

ආ. "කරුණාට ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අවශ්‍ය වුවත් ඒ සඳහා කළයුත්තේ කුමක්දැයි අවබෝධයක් නැත. ඒ සඳහා අවධානය යොමු කළයුතු කරුණු ඔබෙන් විමසයි" පැහැදිලි කරන්න. (ලකුණු 02)

ii. අ. "කේවල ස්වාමි ව්‍යාපාරයක් සඳහා කිසිදු නීතියක් හෝ රෙගුලාසියක් අනුගමනය කළයුතු නැත " ඔබ මෙම ප්‍රකාශයට එකඟ වන්නේද පැහැදිලි කරන්න. (ලකුණු 02)

ආ. සමන්මලී පෙරේරා "සමන්මලී කැෆේ" නමින් ආපන ශාලාවක් ඇරඹීමට අදහස් කරයි නම් ඒ සඳහා ගතයුතු ක්‍රියාමාර්ග කවරේද ? (ලකුණු 02)

iii. අ. සමාගමක් ආරම්භ කිරීමට අවශ්‍ය ලියවිලි කවරේද ? (ලකුණු 02)

ආ. සීමාසහිත පෞද්ගලික සමාගමක් අරඹනවාට වඩා පොදු සමාගමක් ඇරඹීමේ වාසි අවාසි කවරේද ? (ලකුණු 02)

iv. අ. වරලත් ව්‍යාපාරයක් ආරම්භ කළහැකි ප්‍රධාන ක්‍රම කවරේද ? (ලකුණු 02)

ආ. වරලත් ව්‍යාපාරයක් ඇරඹීමෙන් වරලත් හිමියාට හා වරලත් ලාභියාට අත්වන ප්‍රතිලාභ වෙන් වෙන්ව දක්වන්න. (ලකුණු 02)

v. "ව්‍යවසායකයන් යනු අලුත් දෑ නිර්මාණය කරන්නෝය"

අ. ඉහත ප්‍රකාශයට අනුව ව්‍යවසායකයකු තුළ තිබිය යුතු ගති ලක්ෂණ කවරේද ?(ලකුණු 01)

ආ. ව්‍යවසායන් රටේ සංවර්ධනයට දායක වන්නේ කෙසේද ? (ලකුණු 02)

ඉ. නූතන ව්‍යවසායකත්වයේ නව ප්‍රවනතා කවරේද ? (ලකුණු 01)

04. i. අ. හොඳ මුලදක ලක්ෂණ කවරේද ? (ලකුණු 01)

ආ. "පහත සඳහන් වන්නේ ගෙවීම් කිරීම සඳහා භාවිත කළහැකි උපකරණ කිපයකි

- රු 1000 ක නෝට්ටුවක්
- චෙක්පතක්
- ණය පතක්

i. ඉහත උපකරණ කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු $1\frac{1}{2}$)

ii. ඉහත උපකරණවල වාසි අවාසි 01 බැගින් දක්වන්න. (ලකුණු $1\frac{1}{2}$)

ii. අ. පහත දැක්වෙන සංකල්ප පැහැදිලි කරන්න.

i. වලංගු මුදල් හා බැංකු මුදල්

ii. ආසන්න මුද්ල හා විද්‍යුත් මුදල් (ලකුණු 02)

ආ. මුදලේ කාර්යයන් දක්වා පැහැදිලි කරන්න. (ලකුණු 02)

iii. අ. බලපත්‍ර ලාභී වාණිජ බැංකුවක කාර්යයන් කවරේද ? (ලකුණු 02)

ආ. "බලපත්‍ර ලාභී වාණිජ බැංකුවලට පමණක් අයිරා පහසුකම් ලබාදිය හැකිය" එසේ වන්නේ ඇයි ? බැංකු ණයක් හා අයිරාවක් අතර වෙනස්කම් කවරේද ? (ලකුණු 02)

i v. අ. කල්බදු ක්‍රමයට වාහන ලබාගැනීම අද ඉතා ජනප්‍රිය වී ඇත. කල්බදු ක්‍රමය ක්‍රියාත්මක වන ප්‍රධාන ආකාර කවරේද ? පැහැදිලි කරන්න. (ලකුණු 02)

ආ. "මුල්‍ය ආයතනයක මුදල් තැන්පත් කිරීමේදී ඔබ සැලකිලිමත් විය යුතු සාධක කවරේද ? (ලකුණු 02)

v. අ. චෙක්පතකට සම්බන්ධ පාර්ශ්ව කවරේද ? (ලකුණු 01)

ආ. චෙක්පතක් රේඛණය කළ හැකි ප්‍රධාන ක්‍රම කවරේද ? පැහැදිලි කරන්න. (ලකුණු 02)

ඉ. චෙක්පතක් පිටසන් කිරීම යනු කුමක්ද ? (ලකුණු 01)